NALANDA VIDYALAYA **නාලන්දා විද්‍යාලය - කොළඹ 10**

දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 9 ශ්‍රේණිය | විද්‍යාව | කාලය : පැය 1 |
|---|---|---|

## ඒකකය 06 - මානව රුධිර සංසරණ පද්ධතිය

1) හෘදයේ වඩාත් ඝණකම් බිත්ති පිහිටා ඇත්තේ,
   1) වම් කර්ණිකාවේ 2) දකුණු කර්ණිකාවේ
   3) වම් කෝෂිකාවේ 4) දකුණු කෝෂිකාවේ

2) හෘදයට ඉහලින් වූ ඉන්ද්‍රිය තුළින් ආරම්භ වන ශිරා සම්බන්ධ වන්නේ,
   1) අධර මහා ශිරාව 2) උත්තර මහා ශිරාව
   3) පුප්පුශිය මහා ශිරාව 4) මහා ශිරාව

3) රුධිර සෛල වර්ගයක් ලෙස සැලකිය නොහැක්කේ,
   1) නියුට්‍රොෆිල 2) වසා සෛල 3) පට්ටිකා 4) රක්තාණු

4) ධමනියක් ශිරාවකින් වෙනස් වන ලක්ෂණයක් නොවන්නේ,
   1) ධමනි බිත්ති ඝණකමින් වැඩිවීම
   2) ධමනි බිත්ති ප්‍රත්‍යාස්ථ වීම
   3) ධමනිවල කපාට පිහිටීම
   4) ධමනි හෘදයෙන් ඉවතට රුධිරය ගෙන යාම

5) රුධිරය කැටි ගැසීම සඳහා දායක වන සංඝටකය කුමක්ද?
   1) රක්තාණු 2) රුධිර පට්ටිකා 3) ශ්වේතාණු 4) ප්ලාස්ම ප්‍රෝටීන්

6) උත්තර මහා ශිරාව මගින් රුධිරය සපයන හෘත් කුටීරය කුමක්ද?
   1) වම් කර්ණිකාව 2) දකුණු කෝෂිකාව
   3) වම් කෝෂිකාව 4) දකුණු කර්ණිකාව

7) සංස්ථානික මහා ධමනිය ආරම්භ වන ස්ථානයේ පිහිටා ඇති කපාටය වන්නේ,
   1) අඩසඳ කපාට 2) ත්‍රි තුණ්ඩ කපාටය
   3) ද්වි තුණ්ඩ කපාටය 4) මයිටර් කපාටය

8) ත්‍රි තුණ්ඩ කපාටය පිහිටා ඇත්තේ කුමන ස්ථානයේ ද?
   1) වම් කර්ණිකාව හා වම් කෝෂිකාව
   2) දකුණු කර්ණිකාව හා දකුණු කෝෂිකාව
   3) වම් කෝෂිකාව හා සංස්ථානික මහා ධමනිය
   4) දකුණු කෝෂිකාව හා පුප්පුශීය ධමනිය

9) පුප්පුශීය ශිරා ආරම්භ වන්නේ,
   1) වම් කර්ණිකාවෙන් 2) වම් කෝෂිකාවෙන්
   3) පෙනහළු වලින් 4) දකුණු කෝෂිකාවෙන්

EXAMRESULTS.LK

10) රක්තාණු වල කාර්යය වන්නේ,

1) ඔක්සිජන් පරිවහනය කිරීම
2) කාබන්ඩයොක්සයිඩ් වහනය කිරීම
3) ප්‍රතිදේහ නිපදවීම
4) රුධිරය කැටි ගැසීමට දායක වීම

11) පහත ප්‍රකාශ වලින් නිවැරදි වන්නේ කුමක්ද?

A – $Rh^+$ රුධිරය සහිත දායකයෙකුට $Rh^-$ රුධිරය සහිත ප්‍රතිග්‍රාහකයෙකුට රුධිරය සැපයිය හැක.

B – $Rh^+$ රුධිරය සහිත ප්‍රතිග්‍රාහකයෙකුට $Rh^-$ රුධිරය සහිත දායකයෙකුගෙන් රුධිරය ලබා ගත හැක.

1) A පමණකි
2) B පමණකි
3) A හා B දෙකම නිවැරදිය
4) A හා B ප්‍රකාශ දෙකම වැරදිය

12) වැඩිම ඝනකම සහිත බිත්ති පිහිටා ඇත්තේ කුමන හෘත් කුටීරයේ ද?

1) දකුණු කර්ණිකා 2) වම් කර්ණිකා 3) දකුණු කෝෂිකා 4) වම් කෝෂිකා

13) $A^+$ වර්ගයේ රුධිරය සහිත අයෙකුට රුධිරය ලබා දිය හැකි ප්‍රතිග්‍රහකයන් නිවැරදිව දැක්වෙන්නේ,

1) $A^+$, $A^-$ 2) $A^-$, $AB^+$ 3) $A^+$, $AB^+$ 4) $A^-$, O

14) රුධිරය කැටි ගැසීමේ ක්‍රියාවලිය සඳහා දායක වන විටමිනය වන්නේ,

1) විටමින් A 2) විටමින් B 3) විටමින් K 4) විටමින් D

15) ස්වසනයට අවශ්‍ය වන හිමොග්ලොබින් ඔක්සිජන් සමග පරිවහනයට උදව් වන්නේ,

1) රතු රුධිරාණු
2) රුධිර පට්ටිකා
3) සුදු රුධිරාණු
4) රුධිර ප්ලාස්මය වේ

## II කොටස

1)




i) මෙහි 1, 2, 3, 4 කුටීර නම් කරන්න.

ii) F හා H කපාට නම් කරන්න.

iii) ඉහත 1, 2, 3, 4, කුටීර වලට සම්බන්ධ වාහිනී නම් කරන්න.

iv) පහත අවස්ථාවන්ට ගැලපෙන කොටස් අදාළ අක්ෂරය ඉදිරියෙන් ලියන්න.

a) - වැඩිම ඝනකමක් ඇති බිත්ති පිහිටයි

b) - පෙනහළු වලට රුධිරය ගෙන යයි

c) - වම් කෝෂිකාවට යන රුධිරය ආපසු ගැලීම වලක්වයි

d) - මුළු ශරීරයටම රුධිරය බෙදා දෙයි

2) පහත දැක්වෙන්නේ රුධිර කාණ්ඩ කර දැක් වූ සංකල්ප සිතියමකි.




i) ඉහත සටහනේ A සිට B දක්වා කොටස් නම් කරන්න.

ii) රක්තාණු හා B සෛල අතර ඇති වෙනස්කම් 2 ක් ලියන්න.

iii) රක්තාණු B හා C සෛලවල කාර්යන් එක බැගින් ලියන්න.

iv) C සෛල අඩුවීමට හේතුවන රෝග දෙකක් ලියන්න.

v) A හි අඩංගු ජලයේ ද්‍රාව්‍ය හා අද්‍රාව්‍ය ද්‍රව්‍ය දෙකක් බැගින් ලියන්න.

3) රුධිර පාරවිලනයේ දී එකම පවුලේ සාමාජිකයන් අතර පවා රුධිරය නොගැලපිය හැක.

i) රුධිරය පාරවිලනය යනු කුමක්ද?

ii) රුධිර පාරවිලනයේ දී ගැලපිය යුතු සාධක දෙක නම් කරන්න.

iii) රුධිර සණ 4ක් පවතින බව සොයා ගත් විද්‍යාඥයා කවරෙක් ද?

iv) රුධිර දායකයා හා ප්‍රතිග්‍රාහකයා යන්න පැහැදිලි කරන්න.

v) පහත වගුව අනුව රුධිර ලබා දිය හැකි/ නොහැකි ආකාර වගුවේ දක්වන්න.

| ප්‍රතිග්‍රාහකයා / ග්‍රාහකයා | A | B | AB | O |
|---|---|---|---|---|
| B | | | | |
| O | | | | |

vi) රීසස් සාධකය අනුව රුධිරය පාරවිලනය කළ හැකි ආකාරය වගුවේ දක්වන්න.

| ප්‍රතිග්‍රාහකයා / ග්‍රාහකයා | $Rh^+$ | $Rh^-$ |
|---|---|---|
| $Rh^+$ | | |
| $Rh^-$ | | |

vii) රුධිර ශ්ලේශනය යනු කුමක්ද?